**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

AA3 විභාගය - ජූලි 2018

## (AA 32) කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය
## (Management Accounting and Finance)

---

**මෙම ප්‍රශ්නපත්‍රය මුළු ලකුණු 100 කින් සමන්විත වූ අතර කොටස් 3 කින් සමන්විත විය.**

1) A කොටස එක් ප්‍රශ්නයකට ලකුණු 05 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න හතරකින් සමන්විත විය. කොටස සඳහා වූ මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 20 කි.

2) B කොටස එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න තුනකින් සමන්විත විය. මෙම කොටස සඳහා වූ මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 30 කි.

3) C කොටස එක් ප්‍රශ්නයකට ලකුණු 25 බැගින් වූ අනිවාර්යය ප්‍රශ්න දෙකකින් සමන්විත විය. මෙම කොටස සඳහා වූ මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 50 කි.

**පොදු අදහස්**

මෙම ප්‍රශ්නපත්‍රය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතිණි. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්න පත්‍රය සඳහා, විශේෂයෙන්ම ප්‍රශ්න අංක 08 සහ 09 සඳහා සතුටුදායක ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් විය. නමුත් බහුතරයක් අයදුම්කරුවන් ප්‍රශ්න අංක 01 හා 02 සඳහා උත්තර සැපයීමෙන් වැළකී සිටීම හෝ වැරදි උත්තර සපයා තිබීමත් නිරීක්ෂණය විය. මෙයට හේතුව ලෙස සැලකිය හැක්කේ මෙම ප්‍රශ්න කළමනාකරණ ගිණුම්කරණයට අදාළ න්‍යායාත්මක කොටස්වලින් සමන්විතවීමත් එම කොටස් සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම් මට්ටම පහළ මට්ටමක පැවතීමත් ය.

**කොටස් වශයෙන් වූ කාර්යසාධනය**

A කොටස් සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතිණි. නමුත් ප්‍රශ්න අංක 01 හා 02 සඳහා අයදුම්කරුවන් විසින් ලබාගත් ලකුණු ප්‍රමාණය දුර්වල මට්ටමක පැවතිණි.

B කොටස සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබිණි.

C කොටස සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක විය.

### A කොටස

**ප්‍රශ්න අංක 01**

මෙම ප්‍රශ්නය මගින් පුද්ගලික මූල්‍ය සැළසුම්කරණය ගැන පරීක්ෂාවට ලක්කරන ලද අතර පුද්ගලික මූල්‍ය සැලසුම්කරණයේ වාසි 02 ක් සහ ඊට අදාළ මූලික රීති 03 ක් සඳහන් කිරීමට අවශ්‍ය විය.

ඉතා සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත්ව තිබිණි.

අයදුම්කරුවන් සපයා තිබූ උත්තර අනුව නිරීක්ෂණය වූයේ අයදුම්කරුවන්ට කළමනාකරණ ගිණුම්කරණයට අදාළව පුද්ගලික මූල්‍ය සැලසුම්කරණය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති බවයි. ඔවුන් න්‍යායාත්මක කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමකින් තොරව අපැහැදිලි උත්තර සපයා තිබිණි. මෙම නිසා ඔවුනට පුද්ගලික මූල්‍ය සැලසුම්කරණයේ වාසි හා මූලික රීතීන් සඳහන් කිරීමට නොහැකි වී තිබිණි.

**පරීක්ෂකගේ යෝජනා**

ස්ව-අධ්‍යයන ග්‍රන්ථයේ සඳහන් න්‍යායාත්මක කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සම්පූර්ණ විෂය නිර්දේශයම අධ්‍යයනය කිරීමට යෝජනා කෙරේ.

## ප්‍රශ්න අංක 02

'මුදලට සරිලන වටිනාකම' යන්නට සම්බන්ධව සකසුරුවම, කාර්යක්ෂමතාව හා සඵලදායීතාව යන පද පැහැදිලි කිරීම, මෙම ප්‍රශ්නය මගින් අපේක්ෂාකරන ලදී.

බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර සපයා නොතිබිණි. උත්තර සැපයූ අයදුම්කරුවන්ද සතුටුදායක මට්ටමේ ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට අසමත් විය. ප්‍රශ්නය නිවැරදිව තේරුම් නොගැනීමෙත් මුදලට සරිලන වටිනාකමට සම්බන්ධ කරුණු පිළිබඳව වූ අල්ප දැනුමත් මෙම තත්ත්වය සඳහා හේතු විය. අයදුම්කරුවන් සපයා තිබූ උත්තරවලින් නිරීක්ෂණය වූයේ අයදුම්කරුවන් බහුතරයක් තුළ මුදලට සරිලන වටිනාකම සම්බන්ධයෙන් වූ මෙම පද කෙරෙහි අවබෝධයක් නොතිබූ බවයි.

**පරීක්ෂකගේ යෝජනා**

න්‍යායාත්මක කරුණු කෙරෙහි අවධානය යොමුකරමින් සම්පූර්ණ විෂය නිර්දේශයම අධ්‍යයනය කළ යුතුය. මෙවැනි ආකාරයේ ප්‍රශ්න සඳහා උත්තර සැපයීමට ස්ව-අධ්‍යයන පොත් කට්ටලය පරිශීලනය කිරීම අවශ්‍ය වේ.

## ප්‍රශ්න අංක 3

මෙම ප්‍රශ්නය (a) හා (b) වශයෙන් කොටස් දෙකකින් සමන්විත විය. 2017 මාර්තු 31 දිනෙන් සහ 2018 මාර්තු 31 යන දිනෙන් අවසන් වූ වර්ෂ සඳහා වෙළෙඳ ලැබිය යුතු මුදල් එකතුකර ගැනීමේ කාලය (දින වලින්) ගණනය කිරීම (a) කොටස මගින් අපේක්ෂා කෙරුණි. (a) කොටසට අදාළ ගණනය කිරීම් සහ සමාගමේ වර්තමාන තත්ත්වය සැලකිල්ලට ගනිමින් වෙළෙඳ ලැබිය යුතු මුදල් කළමනාකරණය කිරීමට අදාළ උපාය මාර්ග සඳහන් කිරීම (b) කොටස මගින් අපේක්ෂා කරන ලදී. මෙය ඉතා සරල ප්‍රශ්නයක් වූ අතර සමාන ස්වරූපයේ ප්‍රශ්න පසුගිය විභාග ප්‍රශ්න පත්‍රවලද සඳහන් විය.

සමහර අයදුම්කරුවන්ට වෙළඳ ලැබිය යුතු මුදල් එකතුකර ගැනීමේ කාලය ගණනය කිරීමට නොහැකි වී තිබිණි. සමහර අයදුම්කරුවන් වෙළඳ ලැබිය යුතු මුදල් වල සාමාන්‍ය අගය සැලකිල්ලට ගනිමින් ගණනය කිරීම් සිදුකර නොතිබිණි. තවත් සමහර අයදුම්කරුවන් විකුණුම් වෙනුවට විකුණුම් පිරිවැය භාවිතයට ගනිමින් ගණනය කිරීම සිදුකර තිබිණි. තවත් සමහර අයදුම්කරුවන් ගණනය කිරීම් සඳහා විකුණුම් වෙනුවට සාමාන්‍ය විකුණුම් යොදා ගෙන තිබිණි.

(a) කොටසට අදාළ ගණනය කිරීම සහ සමාගමේ ප්‍රවර්තන තත්ත්වය සැළකිල්ලට ගනිමින් වෙළෙඳ ලැබිය යුතු කළමනාකරණයට අදාළ උපායමාර්ග 02 ක් සඳහන් කිරීමට අයදුම්කරුවන් සැලකිය යුතු ප්‍රමාණයක් අපොහොසත්ව තිබිණි. ගණනය කිරීම් සැළකිල්ලට ගනිමින් උපායමාර්ග හඳුනා ගැනීමේ සහ විශ්ලේෂණය කිරීමේ කුසලතාවය අයදුම්කරුවන් විසින් ඇති කරගත යුතුය. සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා වූ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතිණි.

**පරීක්ෂකගේ යෝජනා**

1. ප්‍රශ්නයට උත්තර සැපයීමට පෙර ප්‍රශ්නය හොඳින් කියවන්න.
2. ස්ව-අධ්‍යයන ග්‍රන්ථයෙහි සඳහන් සමාන ආකාරයේ ගණනය කිරීම් හා වෙනත් ගණනය කිරීම් පුරුදු පුහුණු වන්න.
3. අත් අකුරුවල පැහැදිලි බව දියුණු කර ගන්න.

**ප්‍රශ්න අංක 04**

ප්‍රශ්නයෙහි දෙන ලද තොරතුරු පදනම් කරගනිමින් විශේෂ ඇණවුම සඳහා ශ්‍රමයේ අදාල පිරිවැය ගණනය කිරීම අපේක්ෂා කරන ලදී. අවම වැටුපකට යටත් පුහුණු ශ්‍රමිකයන්ගේ ශ්‍රම පිරිවැය අදාල නොවන පිරිවැයක් ලෙස බොහෝ අයදුම්කරුවන් සැලකිල්ලට ගෙන නොතිබිණි. මෙය ගිලුණු පිරිවැයක් ලෙස අයදුම්කරුවන් අවබෝධකර ගත යුතුය. මේ නිසා පුහුණු ශ්‍රමිකයන් සඳහා අදාල සම්පූර්ණ ශ්‍රම පැය ප්‍රමාණයම ගණනය කිරීම් සඳහා උපයෝගී කරගෙන තිබිණි. සමහර අයදුම්කරුවන් අතිරේකව අවශ්‍යවන පුහුණු ශ්‍රම පැය ගණන ගණනය කිරීමට අපොහොසත්ව තිබිණි.

**පරීක්ෂකගේ යෝජනා**

1. අදාල පිරිවැයට සම්බන්ධ සංකල්ප ගණනය කිරීම් සහ ඒවායේ භාවිතයන් සම්බන්ධයෙන් ඉතා හොඳ අවබෝධයක් ලබාගත යුතුය.
2. පසුගිය විභාග ප්‍රශ්නවල සඳහන් සමාන ස්වරූපයේ ප්‍රශ්න පුරුදු පුහුණු විය යුතුය.

**ප්‍රශ්න අංක 05**

(a) කොටසෙහි සඳහන් වූ තොරතුරු මත පදනම්ව එක් එක් තීරණ සඳහා දායකය පෙන්නුම් කරමින් <u>ගෙවුම් වගුවක්</u> පිළියෙල කිරීම සහ Maximax නිර්ණායකය සහ Maximin නිර්ණායක විසඳුම් හඳුනා ගැනීම අපේක්ෂා කරන ලදී.

අයදුම්කරුවන් සැළකිය යුතු ප්‍රමාණයක් සාර්ථකව උත්තර සපයා නොතිබුණු අතර වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට අපොහොසත් විය. අපේක්ෂිත ඉල්ලුමේ පහළ, මධ්‍ය හා ඉහළ මට්ටම සැලකිල්ලට ගනිමින් <u>ගෙවුම් වගුව</u> පිළියෙල කර ගත යුතුව තිබිණි. එම තොරතුරු හඳුනා ගැනීමට සමහර අයදුම්කරුවන් අපොහොසත් වී තිබිණි. වැඩමුර 03 ට අදාළව ගෙවුම් වගුව පිළියෙල කිරීමට බොහොමයක් අයදුම්කරුවන් මෙම ඉල්ලුම් මට්ටම් තුන අවබෝධ කරගෙන නොතිබිණි. නිවැරදි ආකාරයට තීරු සහ පේළි භාවිතා කරමින් වගුව පිළියෙල නොකිරීම පොදුවේ සිදුකර තිබූ වැරැද්දකි. බොහොමයක් අයදුම්කරුවන් පෙරවැඩ නිවැරදිව දක්වා නොතිබිණි. ගණනය කිරීම් සිදු කිරීමේදී සමහර අයදුම්කරුවන් අංක ගණිතමය වැරදි සිදුකර තිබිණි. සමහර අයදුම්කරුවන් <u>ගෙවුම් වගුව</u> පදනම් කර ගනිමින් (b) කොටස සඳහා Maximax සහ Maximin නිර්ණායක හඳුනාගෙන නොතිබුණි. බොහෝමයක් අයදුම්කරුවන්ට Maximax නිර්ණායකය සහ Maximin නිර්ණායක විසඳුම් හඳුනා ගැනීමේ පැහැදිලි අවබෝධයක් නොතිබූ බව නිරීක්ෂණය විය.

**පරීක්ෂකගේ යෝජනා**

- සමාන ස්වරූපයේ පසුගිය විභාග ප්‍රශ්න හා ස්ව-අධ්‍යයන ග්‍රන්ථයේ සඳහන් ප්‍රශ්න පුරුදු පුහුණු වන්න.
- පෙරවැඩ පැහැදිලිව දක්වන්න.

**B කොටස**

**ප්‍රශ්න අංක 06**

මෙම ප්‍රශ්නය අදාල පිරිවැය සම්බන්ධ තීරණ ගැනීම් පිලිබඳව යොමු වූ ප්‍රශ්නයක් විය. දී ඇති තොරතුරු පදනම් කරමින් '×' සංරචකය පිටතින් මිලදී ගතයුතුද නැද්ද යන්න තීරණය කිරීම අවශ්‍ය විය.

අයදුම්කරුවන් සැලකිය යුතු ප්‍රමාණයක් සාර්ථකව උත්තර සපයා නොතිබුණු අතර ප්‍රශ්නය සඳහා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට අපොහොසත්ව තිබිණි. සමස්තයක් ලෙස කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතිණි. අතිරේක පිරිවැය හා පිරිවැයට අදාළ ඉතිරි කිරීම් හඳුනා ගැනිම සඳහා වූ ගණනය කිරීම් සිදු කිරීමට අයදුම්කරුවන්ගෙන් සැළකියයුතු ප්‍රමාණයක් අපොහොසත්ව තිබිණි. අයදුම්කරුවන් කිහිපදෙනෙක් ගණනය කිරීම් නිවැරදිව සිදු කලත් ඒවා පදනම් කර ගනිමින් අදාළ නිර්දේශ තක්සේරු කිරීමට අපොහොසත්ව තිබිණි.

**පරීක්ෂකගේ යෝජනා**

1. සමාන ස්වරූපයේ පසුගිය විභාග ප්‍රශ්න පුරුදු පුහුණු වන්න.
2. 'තක්සේරු කරන්න' යනුවෙන් ප්‍රශ්නය අසා ඇතිවිට ගණනය කිරීම් මත පදනම්ව නිර්දේශ ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

## ප්‍රශ්න අංක 07

2018 ජූනි මාසය සඳහා අයවැයගත සංඛ්‍යා, සත්‍ය සංඛ්‍යා සහ අයවැයගත සහ සත්‍ය සංඛ්‍යා අතර වෙනස්කම් පැහැදිලිව පෙන්නුම් කරමින් මෙහෙයුම් ප්‍රකාශනයක් පිළියෙල කිරීම ප්‍රශ්නය මගින් අපේක්ෂා කෙරිණි.

අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.

අයදුම්කරුවන් සැළකිය යුතු ප්‍රමාණයක් 2018 ජූනි මාසය සඳහා අයවැයගත හා සත්‍ය අගයන් අතර වෙනස ගණනය කිරීමට අපොහොසත් විය. සමහර අයදුම්කරුවන් ගණනය කිරීම්වලදී අංක ගණිතමය වැරදි සිදුකර තිබිණි. අයදුම්කරුවන් කිහිපදෙනෙක් මෙහෙයුම් ප්‍රකාශනය පිළියෙල කිරීම සඳහා විචල්‍ය විකුණුම් කොමිස් ප්‍රමාණය යොදාගෙන නොතිබිණි.

**පරීක්ෂකගේ යෝජනා**

1. සමාන ස්වරූපයේ ප්‍රශ්න සහ පසුගිය විභාග ප්‍රශ්න පුරුදු පුහුණු වන්න.
2. මෙහෙයුම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ ආකෘතිය අයදුම්කරුවන් විසින් අධ්‍යයනය කළ යුතුය.

# C කොටස

## ප්‍රශ්න අංක 08

A කොටස මගින් ප්‍රාග්ධනය පිරිවැය ගණනය කිරීමට අදාළ දැනුමද B කොටස මගින් ආයෝජන ඇගයීම පිළිබඳ වූ දැනුම ද පරීක්ෂා කරන ලදී.

(A) මෙම කොටස සඳහා වූ කාර්යසාධනය හොඳ මට්ටමක පැවතිණි. මේ නිසා අයදුම්කරුවන් වැඩි දෙනෙක් ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගැනිමට සමත් විය.

සමහර අයදුම්කරුවන් ගණනය කිරීම් වලදී අංක ගණිතමය වැරදි සිදු කරනු දක්නට ලැබිණි. සමහර අයදුම්කරුවන් ප්‍රාග්ධන පිරිවැය සමීකරණය සඳහන් කිරීමේදී +/- ලකුණු වැරදි ආකාරයෙන් සඳහන් කර ති බිණි. සමහර අයදුම්කරුවන් සාමාන්‍ය කොටස්වලට අදාළ ප්‍රාග්ධන පිරිවැය ගණනය කිරීම සඳහා වර්ධන අනුපාතය යොදාගෙන නොතිබිණි. සාමාන්‍ය කොටස්වල සහ ණයකරවල ප්‍රාග්ධන පිරිවැය සඳහන් කිරීමේදී අයදුම්කරුවන් % ලකුණ සඳහන් කර නොතිබිණි.

අයදුම්කරුවන් සැලකිය යුතු ප්‍රමාණයක් වෙළඳපොළ වටිනාකම සැලකිල්ලට ගනිමින් බරතැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය ගණනය කර නොතිබිණි.

(B) ශුද්ධ වර්තමාන අගය සහ අභ්‍යන්තර එලදා අනුපාතිකය සැළකිල්ලට ගනිමින් ආයෝජනයේ ශක්‍යතාවය ඇස්තමේන්තු කිරීමට අපේක්ෂා කරන ලදී. අයදුම්කරුවන් බහුතරයක් මෙම ප්‍රශ්නයට සාර්ථකව උත්තර සපයා තිබිණි. සමහර අයදුම්කරුවන් ආරම්භක පිරිවැය මුදල් ගලායාමක් ලෙස වරහන් තුළ සඳහන් කර නොතිබිණි. සමහරක් අයදුම්කරුවන් කාරක ප්‍රාග්ධනය හා කාරක ප්‍රාග්ධනය නැවත අයකර ගැනීම සැළකිල්ලට ගෙන නොතිබිණි. තවත් සමහර අයදුම්කරුවන් වැරදි ලෙස 05 වන වර්ෂය සඳහා ද ප්‍රාග්ධන ප්‍රතිපාදන ගණනය කර තිබිණි. සමහර අයදුම්කරුවන් වැරදි ආකාරයට ශුද්ධ වර්තමාන අගය ගණනය කිරීම සඳහා ද ප්‍රාග්ධන ප්‍රතිපාදන යොදාගෙන තිබිණි.

**පරීක්ෂකගේ යෝජනා**

- විෂයට අදාළ න්‍යාත්මක කොටස් සහ ප්‍රාග්ධන පිරිවැයට අදාළ සමීකරණ අධ්‍යයනය කරන්න. එක් එක් සමීකරණය කට පාඩමින් දැන ගැනීම වෙනුවට එයට පාදක වී ඇති පදනම් පිළිබඳව අධ්‍යයනය කිරීම වැදගත් වේ.
- උත්තර ලබා ගැනීමට අදාළ පියවර සහ ගණනය කිරීම් පෙන්නුම් කළ යුතුය.
- උත්තර දෙවරක් පරීක්ෂා කිරීම මගින් අංක ගණිතමය වැරදි වළක්වාගත හැක.
- ස්ව-අධ්‍යයන ග්‍රන්ථයේ සහ පසුගිය විභාග ප්‍රශ්නවල ගණනය කිරීම්, අධ්‍යනය කිරීම සහ පුරුදු පුහුණු කිරීම වැදගත් වේ.

**ප්‍රශ්න අංක 09**

A **කොටස**

මෙම ප්‍රශ්නය මගින් ප්‍රමිත පිරිවැයකරණයේ විචලනයන් හා අයවැයගත දායකය හා සත්‍ය දායකය සැසඳීම සඳහා මෙහෙයුම් ප්‍රකාශනයක් පිළියෙල කිරීම සඳහාවන දැනුම පරීක්ෂා කරන ලදී.

**කාර්යසාධනය**

සෑම අයදුම්කරුවෙක්ම පාහේ මෙම ප්‍රශ්නය සඳහා උත්තර සපයා තිබූ අතර (A) කොටස සඳහා වූ කාර්යසාධනය හොඳ මට්ටමක පැවතිණි. සමහරක් අයදුම්කරුවෙක් විකුණුම් පරිමා ආන්තික විචලනය නිවැරදිව ගණනය කර නොතිබිණි. සමහර අයදුම්කරුවන් ගණනය කරන ලද විචලනය වාසිදායකද අවාසිදායකද යන්න සඳහන් කර නොතිබිණි. සමහර අයදුම්කරුවන් මෙහෙයුම් ප්‍රකාශනයක් වෙනුවට නම්‍ය අයවැයක් පිළියෙල කර තිබිණි.

B **කොටස**

දී ඇති තොරතුරු අදාළ කරගෙන සමස්ත ලාභ පරිමා අනුපාතිකය සහ එක් එක් නිෂ්පාදිත වර්ගය සඳහා වෙන වෙනම මාසික සමච්ඡේදන මට්ටම පෙට්ටි ගණනින් ගණනය කිරීම අපේක්ෂා කෙරුණි. සැළකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් පෙට්ටියකට අදාළ දායකය නිවැරදිව ගණනය කර තිබුණද සමස්ත ලාභ පරිමා අනුපාතිකය හා මාසික සමච්ඡේදන මට්ටම් ඒ ඒ නිෂ්පාදිතය සඳහා වෙන් වෙන්ව ගණනය කර නොතිබිණි. සමහර අයදුම්කරුවන් වැරදි ලෙස ලාභ පරිමා අනුපාතය නිෂ්පාදිත දෙක සඳහා වෙන් වෙන්ව ගණනය කර තිබිණි.

**පරීක්ෂකගේ යෝජනා**

1. විෂයයට අදාළ න්‍යායාත්මක කොටස් සහ සමීකරණ අධ්‍යයනය කරන්න. සමීකරණ කටපාඩමින් දැනගන්නවා වෙනුවට ඒවාට පදනම් වී ඇති මූලධර්මයන් අවබෝධකර ගැනීම වැදගත් වේ. ගණනය කිරීම්වලට අදාළ පියවර හා පෙරවැඩ පැහැදිලිව සඳහන් කිරීම වැදගත් වේ.
2. උත්තර දෙවරක් පරීක්ෂා කිරීම මගින් අංක ගණිතමය වැරදි ඉවත් කර ගැනීමට උත්සාහ කරන්න.
3. ස්ව-අධ්‍යයන ග්‍රන්ථයේ සහ පසුගිය විභාග ප්‍රශ්න පත්‍රවල ඇති ගණනය කිරීම් අධ්‍යයනය කරන්න. ඒවා පුරුදු පුහුණුවන්න.

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැළකිල්ල යොමු කළ යුතු පොදු කරුණුඃ**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳීන් අධ්‍යයනය කරතිබීම සහ නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.
2. ප්‍රශ්නය කිහිපවතාවක් මනා අවධානයකින් කියවිය යුතු අතර, අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.
3. ප්‍රශ්න වලට උත්තර සැපයීමේදී උපකල්පනයන් කර ඇත්නම් ඒවා පැහැදිලිව පෙන්විය යුතුය.
4. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය. උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.
5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.
6. පසුගිය විභාග ප්‍රශ්නපත්‍ර සහ යෝජිත උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය. සමාන රටාවන්ගෙන් හා ව්‍යුහයන්ගෙන් යුත් ප්‍රශ්න නැවත නැවත විභාගයන්හිදී පරීක්ෂා කළ හැකි බැවින් මෙම ක්‍රමය අනුගමනය කිරීම වාසිදායකය.
7. ස්ව අධ්‍යයන පාඩම් මාලා අධ්‍යයනය කිරීම සහ එහි ඇති උත්තර පරිශීලනය කිරීම ඉතා වැදගත්ය.
8. මෙම විෂය සම්බන්ධව ඇති පොත්පත්, සඟරා හා ලිපි ආදිය පරිශීලනය කළ යුතුය.
9. විභාගයේදී කාලය මනා කළමනාකරණය කර ගැනීම, එක් එක් ප්‍රශ්නයට වෙන්කර ඇති ලකුණු මඟින් ඒ සඳහා වෙන් කළ යුතු කාලය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.
10. පෙර සූදානමක් සහිතව විභාගය සමත් වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.